**ශීර්ෂය 263 - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-----------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 28 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබුණු නිර්දේශයන් ක්‍රියාත්මක කර ඇති බව.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දැක්විය යුතු තැන්පතු ලැබීම් රු.875,957,552 ක් හා වෙනත් ලැබීම් රු.550,385,916 ක් වුවත් දක්වා තිබූ වටිනාකම පිළිවෙලින් රු.876,397,002 ක් හා රු.549,946,466 ක් විය. මෙම ලැබීම් දෙක අතර වෙනසට හේතුව රු.439,450 ක වෙනත් ශීර්ෂයකට අදාල තැන්පතු ලැබීම් වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත නොකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල තැන්පතු ලෙස ගිණුම්ගත කර තිබීම බව අනාවරණය විය. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | සිගාස් වැඩසටහන යටතේ ලබාගත් ඒකාබද්ධ ශේෂ පිරික්ෂුමට අනුව ගිණුම් පිළියෙල කර ඇති බව . |
| (ආ) | භාණ්ඩාගාර පරිසණක මුද්‍රිත අනුව අත්තිකාරම් ලැබීම් ශේෂය රු.81,605,145 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.71,081,815 ක් ලෙස දක්වා තිබුණි. | - එම - | සිගාස් වැඩසටහන යටතේ ලබාගත් ඒකාබද්ධ ශේෂ පිරික්ෂුමට අනුව ගිණුම් පිළියෙල කර ඇති බව . |

| | | | |
|---|---|---|---|
| (ඇ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව තැන්පතු ගෙවීම් රු.905,389,872 ක් වුවද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු.905,390,922 ක් ලෙස රු.1,050 ක් වැඩියෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළයුතු වීම. | මෝටර් රථ තැන්පතු ගෙවීම් රු.1,050 මෙම වෙනසට හේතුව බව. |

## 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2019 පෙබරවාරි 11 දිනැති අංක PS/NC/4/ CP/41/2019දරන අමාත්‍ය මණ්ඩල සංදේශය | සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ට ණය සහන ලබාදීමේ වැඩසටහන යටතේ සහල් නිෂ්පාදකයින්ගේ සී/ස සමුපකාර සමිතියක් වෙත 2019 අප්‍රේල් 05 වන දින ලබාදුන් රු.38,000,000 ක පොලී රහිත ණය මුදල් 2019 ඔක්තෝබර් 05 දින වන විට මෝල්හිමියන්ගෙන් සම්පූර්ණ වශයෙන් අයකර ගතයුතු වුවත් විගණිත දිනය වූ 2020 ජුනි 30 දින වන විටත් රු.26,445,848ක මුදලක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | ආපසු අයකර ගැනීමේ අරමුණින් ජාතික අවශ්‍යතාවයන් වෙනුවෙන් යොදන ලද රජය සතු මුදල් නියමිත කාර්යය අවසානයේ අදාල පාර්ශවයන්ගෙන් අයකරගෙන ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතුවීම. | 2020.06.18 දිස්ත්‍රික් ලේකම් හා වී මෝල්හිමියන් අතර පැවති රැස්වීමේදී මෝල් හිමියන් විසින් මාස 03 ක සහන කාලයකට හා ණය ගෙවීමේ ක්‍රමවේදයකට යටත්ව එම ණය ගෙවා අවසන් කිරීමට එකඟ වී ඇති බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 10(1) ඡේදය හා 2003 අගෝස්තු 28 දිනැති අංක 1303/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 15 ඡේදය | **i.** ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුද්ගලික ඉඩමක පවත්වාගෙන ගොස් තිබූ කළුගල් වැඩබිම, තම පුද්ගලික ඉඩමේ සීමාව ඉක්මවා රජයේ ඉඩමේ හෙක්ටයාර් 0.6227 ක භූමියේ අනවසරයෙන් කළුගල් කියුබ් 10,911 ක් කැණීම් කර තිබූ අතර, ඒ සඳහා චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ගාස්තු අයකරගෙන නොතිබුණි. | රජයේ ඉඩම් සහ දේපල අනවසර පරිහරණය වලක්වා ගැනීමටත්, අනවසර පරිහරණය කළ දේපල සඳහා නියමිත රජයේ ගාස්තු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුවීම. | 2019.12.12 දින දිස්ත්‍රික් ලේකම් සමඟ පැවති සාකච්ඡාවේදී නිරීක්ෂණය පිළිගෙන ඇත. |
| | | **ii.** තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංජලීගල ග්‍රාම නිලධාරී වසමේ ආසන්න වශයෙන් අක්කර 02 ක පමණ විශාලත්වය ඇති රජයේ ඉඩමක පුද්ගලයින් තිදෙනෙකු විසින් දීර්ඝ කාලයක සිට අනවසරයෙන් කළුගල් වැඩබිමක් පවත්වාගෙන ගොස් තිබූ අතර භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2019 ඔක්තෝබර් 15 දිනැති වාර්තාව ප්‍රකාරව එම කාලසීමාව තුළදී කළුගල් කියුබ් 41,336 ක් කැණීම් කර තිබූ බව වාර්තා විය. රජයේ ඉඩම මෙසේ පරිහරණය කිරීම වෙනුවෙන් රජයේ ගාස්තු අයකර ගෙන නොතිබුණි. | රජයේ ඉඩම් දේපල සහ ඛණිජ ද්‍රව්‍ය ආරක්ෂා කර ගැනීම රජයේ නිලධාරීන්ගේ වගකීමක් වන අතර, අනවසර පුපුරණද්‍රව්‍ය භාවිතයට ඇති අවස්ථා වලක්වා ගැනීමද නිලධාරීන්ගේ වගකීමකි. | නිරීක්ෂණය පිළිගනිමි. 1995 වර්ෂයේ සිට කැණීම් ක්‍රියාත්මක වී ඇති බව, අතින් කළුගල් කැඩීම සඳහා අවසර ලබාදී තිබූ බව සහ කම්ප්‍රෙෂර් යන්ත්‍ර භාවිතා කරමින් ගල් කැණීම කරන බව වාර්තා කිරීමෙන් අනතුරුව මේ බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කැණීම් ඉංජිනේරු වෙත හා වීරවිල පොලිස් ස්ථානාධිපති වෙත වාර්තා කර ඇති බව. |

| | | | |
|---|---|---|---|
| | **iii.** හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක පවත්වාගෙන යනු ලබන කළුගල් වැඩබිම් 12කින් ඉහත නීති විධිවිධාන අනුව අයකළ යුතු රජයේ ගාස්තු අඩුවෙන් අයකිරීම හා කැණීම් කරන ලද ගල් කියුබ් ප්‍රමාණය අඩුවෙන් ගණනය කිරීම නිසා 2009 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකතුව රු.198,898,250 ක පමණ මුදලක් රාජ්‍ය ආදායමට අහිමි වී තිබුණි. | පනවා ඇති නිති රීති විධිවිධාන අනුව නියමිත රජයේ ගාස්තු අයකර ගැනීම සඳහා කටයුතු කළයුතු වීම. | නිරීක්ෂණය පිළිගනිමි. රජයේ ආදායම එකතු කිරීමට අදාල චක්‍රලේඛ සංශෝධනය වීම පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත හෝ දැනුවත් කිරීම් සිදු නොකළ බැවින් ගාස්තු අඩුවෙන් අයකර ඇති බව. |
| (ඇ) ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛ ------------------------- | | | |
| 2004 අප්‍රේල් 14 දිනැති අංක 04/සීඑස්/3/10/1/ පොදු දරන ලිපිය | ඩයිනමයිට් කි.ග්‍රෑ.01 කින් කඩා ගත හැකි කළුගල් ප්‍රමාණය කියුබ් 2 ½ ක් ලෙස ගණනය කර වන ආඥාපනත යටතේ ගාස්තු අයකරයි. කැණීම් කටයුතු සඳහා පුපුරණ ද්‍රව්‍ය පාලක විසින් ඇමෝනියම් නයිට්‍රේට්, ඩයිනමයිට් සහ ගල්වෙඩි බෙහෙත් යන පුපුරණ ද්‍රව්‍ය තුනම නිකුත් කර තිබුණද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ගාස්තු අයකිරීමේදී කණිනු ලබන කළුගල් කියුබ් පරිමාව ගණනය කරනු ලබන්නේ ඩයිනමයිට් යන පුපුරණ ද්‍රව්‍ය පදනම් කරගෙන පමණි. | රජයේ ගාස්තු අයකිරීම සඳහා නිකුත් කරනු ලබන සියළු පුපුරණ ද්‍රව්‍ය පදනම් කරගෙන කැණීම් පරිමාව ගණනය කිරීම සඳහා ක්‍රම වේදයක් සකස් කළ යුතු වීම. | නිරීක්ෂණ පිළිගනිමි. 2017.10.16 දින පවත්වන ලද දිසාපති සමුළුවේදීද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය නියෝජනය කරමින් ඉදිරිපත්ව සිටි නිලධාරියා විසින්ද මේ බව තහවුරු කරන ලදබව. |

(ඇ) ජාතික අයවැය චක්‍රලේඛ

-----------------

| | | | |
|---|---|---|---|
| 2019 ජුනි 17 දිනැති 04/2019 දරන චක්‍රලේඛයේ 02 සහ 03 ඡේදය | හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෝරාගත් නව සමෘද්ධිලාභීන් 13,387 දෙනෙකුගෙන් ප්‍රතිලාභීන් 4186 දෙනෙක් සඳහා සමෘද්ධි හිමිකම් පත්‍ර ලබාදීමේ උත්සවයේ සංග්‍රහ, ඉන්ධන, ලිපිද්‍රව්‍ය ඇතුළු වියදම් වෙනුවෙන් රු.645,503 ක් හා ප්‍රතිලාභීන්ට ලබාදිම වෙනුවෙන් අඹ පැල 5000 ක් මිලදි ගැනීම වෙනුවෙන් රු.1,495,000 ක්ද ඇතුළුව රු.2,140,503 ක් දැරීම තුළින් චක්‍රලේඛ ප්‍රකාරව 2019 වර්ෂයේ රාජ්‍ය වියදම් විචක්ෂණශිලීභාවයකින් සිදුකර නොමැති බව නිරීක්ෂණය වේ. | චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතු වීම. | රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ එක් අවස්ථාවක් ලෙස පැවැත්වූ මෙම උත්සවය පාලනයට දිස්ත්‍රික්කයක් වශයෙන් හැකියාවක් නොතිබූ බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 වියදම් කළමනාකරණය

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 66 සහ 69 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂය 07 ක ඉතිරි වූ ප්‍රතිපාදන රු.5,851,000 ක් වෙනත් පුනරාවර්තන වැය විෂයයන් 06 කට මාරුකර තිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.50(ii) ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාක් දුරට සම්පූර්ණවත්, නිවැරදිවත් පිළියෙල කල යුතුවීම. | 20/2018 චක්‍රලේඛය ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ සංයුක්ත දීමනාව සංශෝධනය කිරීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචිත වාහන බොහොමයක් අබලන් තත්ත්වයේ පැවතීම නිසා නිතර අලුත්වැඩියා කිරීමට |

| | | |
|---|---|---|
| | | සිදුවීම, ප්‍රාග්ධන වැය විෂයන්ගේ ප්‍රතිපාදනවලින් සියයට 15 ක් කපාහැරීමට සිදුවීම නිසා 2002 වැය විෂයට අදාල වියදම් 1302 න් දැරීම හා 2003 ට අදාල වියදම් 1301 න් දැරීම ආදී කරුණු නිසා ප්‍රතිපාදන මාරු කිරීමට සිදුවූ බව. |

## 2.2 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර තිබූ අග්‍රිමය රු.8,020,934,000 ක් වුවත් නිකුත් කර තිබූ අග්‍රිමය රු.3,436,248,000 ක් විය. ඒ අනුව රු.4,584,686,000 ක අග්‍රිමය භාණ්ඩාගාරයෙන් නොලැබීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ සංවර්ධන කටයුතු සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන සම්පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට අවස්ථාව සැලසී නොතිබුණි. උදාහරණ වශයෙන් ගම්පෙරළිය වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක් වෙත ව්‍යාපෘති 384 ක් වෙනුවෙන් වෙන්කළ ප්‍රතිපාදන රු. මිලියන 173 ක් නොලැබීම නිසා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | සැලසුම් කළ ව්‍යාපෘති නියමිත පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් නියමිත අග්‍රිම මුදා හැරීම මගින් මෙවැනි ගැටළු මගහරවා ගත හැකිය. | නිරීක්ෂණ පිළිගනිමි. |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| i. | තිස්සමහාරාම හා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩ තහනමට ලක්වී සිටි නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව වූ රු.443,538 ක් දිගුකාලයක සිට අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | කල් පසු වූ ණය ශේෂ අයකර ගැනීමට පියවර ගත යුතු වීම. | එක් නිලධාරියෙකුගේ දියණිය විසින් ගෙවීමට කැමැත්ත ප්‍රකාශකර ඇති බැවින් වාරික 60කින් අයකර ගැනීමට ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අනුමැතිය ඉල්ලා ඇති බවත්,අනෙක් නිලධාරියාගෙන් අයකර ගතයුතු මුදල සඳහා නීතිපති උපදෙස් පතා යොමුකර ඇති බව. |
| ii. | හම්බන්තොට හා අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙහි සේවය හැරගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ රු.176,144 ක් අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු ණය ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළයුතු වීම. | එක් නිලධාරිනියක - -ගෙන් අයකරගත යුතු මුදල ඇපකරුගෙන් අයකර ගැනීමට අදාලව ගැටළු පවතින බවත් අනෙක් නිලධාරියා - -ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය උපදෙස් ඉල්ලා ඇති බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ මැයි මස ඇතිවූ ගංවතුර හා නායයාම් හේතුවෙන් ජන ජීවිතය පවත්වාගෙනයාම අවධානම් සහිත ප්‍රදේශවල ජනතාව වෙනත් ප්‍රදේශවල පදිංචි කිරීමේ අරමුණින් 2017, 2018 සහ 2019 යන වර්ෂවලදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක සුරක්ෂිත ප්‍රදේශවල නිවාස ඉදිකිරීම සඳහා රු.127,450,000 ක මුදල් ප්‍රතිලාභීන් 91 දෙනෙකුට ලබාදී තිබූ අතර විගණිත දිනය වූ 2020 ජනවාරි 03 දින වන විටත් ව්‍යාපෘතියේ අරමුණ වූ අවධානම් සහිත ප්‍රදේශවල ජනතාව නව නිවාස වල නැවත පදිංචිවීම සිදුවී නොතිබුණි. නියැදි පරීක්ෂාවට අනුව කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එකතුව රු.11,025,000 ක් ලබාදී තිබූ ප්‍රතිලාභීන් 07 දෙනෙකුද, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.1,575,000 ක මුදලක් ලබාදී තිබූ බුද්ධියාගම එක් ප්‍රතිලාභියෙකුද, ඕකෙවෙල කැන්දකැටිය රු.900,000 ක් ලබාදී තිබූ එක් ප්‍රතිලාභියෙකුද හා බෙලිඅත්ත නෙළුව රු.200,000 ක මුදලක් ලබාදී තිබූ එක් ප්‍රතිලාභියෙකුද විවිධ වූ කාරණා හේතු කොට ගෙන නව නිවාසවල පදිංචියට නොගොස් අවධානම් සහිත ප්‍රදේශවලම පදිංචිව සිටීම. | වැඩසටහනෙහි අරමුණු ඉටුවන අයුරින් ප්‍රතිලාභීන් තෝරා ගැනීමටත්, කාර්යසාධනය ඇගයීමෙන් පසුව මුදල් නිදහස් කිරීමටත්, පසු විපරම් අඛණ්ඩව සිදුකිරීමටත් පියවර ගත යුතුවීම. | පදිංචිය සඳහා නොපැමිණි පුද්ගලයන් වෙත වහා නව නිවසේ පදිංචිය තහවුරු කරන මෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ලිපි යවා ඇති බව. |

## 3.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර වැඩසටහන 1 අදියර යටතේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 හි ග්‍රාම ශක්ති ජනතා සමිති 36 ක ජීවනෝපාය සංවර්ධන කාර්යය සඳහා ලබාදුන් රු.27,757,257 ක් විගණිත දිනය වූ 2020 මැයි 15 දින දක්වා ප්‍රයෝජනයට නොගෙන වර්ෂයක පමණ කාලයක් සමිතිවලම ඉතුරුම් ලෙස පැවතුණි. | රජය සතු මුදල් මහජනතාවගේ සුභ සාධනය උදෙසා වැය කිරීමකින් තොරව රඳවා තබාගැනීමට ඉඩ නොහැර ප්‍රතිපාදන වෙන්වී ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුවීම. | ග්‍රාම ශක්ති ව්‍යාපාරය පසුගිය රජය යටතේ ආරම්භ කරන ලද වැඩසටහනක් වීම නිසා රාජ්‍ය තන්ත්‍රයේ ඇතිවූ වෙනස්කම් අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලැබී නොමැති බව. |
| (ආ) ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර වැඩසටහන **ii** අදියර යටතේ ග්‍රාම ශක්ති ජනතා සමිති 108 ක් ආරම්භ කර තිබුණද ඒ සඳහා අවශ්‍ය වන සංවර්ධන සැලසුම් සකසා නොතිබුණි. | - එම - | ඉහත අදහස් දැක්වීම අදාල වේ. |

## 3.3 ව්‍යාපෘති ඉටුකිරීමේ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.3.1 නව තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සහ මායිම් තාප්පය ඉදිකිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඕකෙවෙල

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී සහ කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී හඳුනාගත් දුර්වලතා** | | |
| **i.** ගොඩනැගිලි සැලසුම් කිරීම හා ඉංජිනේරු ඇස්තමේන්තුව සැකසීමේදී භූමිය සහ සේවාදායකගේ අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත් වී නොතිබුණි. ඉදිකිරීම් සිදුකිරීමේදී ගොඩනැගිලි සැලැස්මේ වෙනස්කම් සිදුකර තිබූ අතර, අමතර වැඩ ලෙස අයිතම 72 ක් සඳහා රු.5,405,626 ක් ගෙවා තිබුණි. ඒ අනුව ගොඩනැගිලි සැලැස්ම සහ ඉංජිනේරු ඇස්තමේන්තුව සැකසීම ඉතා දුර්වල මට්ටමක පැවතුණු බව නිරීක්ෂණය කෙරේ. | ඉදිකිරීම පිළිබඳව ඇස්තමේන්තු පිළියෙල කිරීමට පෙර ඉදිකිරීම් භූමිය පිළිබඳව හා සේවා දායකයන්ගේ අවශ්‍යතාවය පිළිබඳව සලකා බැලිය යුතුය. | එවකට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පැවැති භූමියේ ඉදිරිපිට සැලසුම් කරන ලද ගොඩනැගිල්ල වෙනත් භූමියක ඉදිකිරීමට සිදුවීම නිසා ගලපා ගැනීමේදී ඇති වූ ගැටළු බව. |
| **ii.** තෝරාගත් පලමු ලංසුකරුගේ කාර්යසාධන හා අත්තිකාරම් ඇපකරය යන දෙකම සාවද්‍ය ඒවා වුවත්, ඒ පිළිබඳව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) දැනුවත් කිරීමට හෝ කොන්ත්‍රාත්කරුට එරෙහිව ගෙන තිබූ ක්‍රියාමාර්ග අනාවරණය නොවූ අතර, නව කොන්ත්‍රාත්තුව පැවරීම මගින් රජයට රු.3,677,718 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබුණි. | මුදල් රෙගුලාසි 101 සිට 110 දක්වා වූ රෙගුලාසි පරිදි කටයුතු කළයුතු මෙන්ම රජයට වඩා වාසිදායක වන පරිදි හා රජයේ පිරිවැය අවම වන පරිදි කටයුතු කළයුතුය. | නීති කටයුතු සඳහා ලිපිලේඛනවල මුල් පිටපත් අධිකරණයට භාරදී ඇති බව. |

**(ආ) ඉංජිනේරු ඇස්තමේන්තු සැකසීමේදී සිදුවූ අඩුපාඩු සහ මූල්‍ය අලාභයන්**

**------------------------------------------**

| | | | |
|---|---|---|---|
| **i.** | ඉංජිනේරු ඇස්තමේන්තුවේ ප්‍රධාන වැඩ විෂයයන් 3 ක රු.5,484,292 ක වැඩ අත්හැර තිබුණි. එසේ වුවද අත්හල වැඩ සඳහා රු.948,973 ක වැඩ පූර්ව අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. | ඉටුකළ හැකි වැඩ විෂයයන් සහිතව ඇස්තමේන්තු පිළියෙල කර එම වැඩ විෂයයන් ඉටුකරවා ගැනීමට වගබලා ගතයුතුය. | ගොඩනැගිල්ල ඉදිකරන අතර මෙම අයිතම සඳහා භූමි අලංකරණය යටතේ ප්‍රතිපාදන සැලසුන බැවින් මෙම අයිතම ඉටුකිරීම මෙම ඇස්තමේන්තුව යටතේ ඉටු නොකළ බව. |
| **ii.** | ඉංජිනේරු ඇස්තමේන්තුව අනුව විදුලි තතැදීම සඳහා රු.2,245,030 ක් ඇස්තමේන්තු කර තිබුණද අමතර වැඩ සහ බාහිර වැඩ ලෙස සමස්ථ විදුලි පද්ධතිය වෙනුවෙන් රු.4,996,348 ක් ගෙවා තිබුණි. තවද ගොඩනැගිල්ලේ තෙකලා විදුලි සැපයුමක් සඳහා රු.12,175 ක් වූ ප්‍රමාණවත් නොවූ ඉංජිනේරු ඇස්තමේන්තු සකසා තිබුණි. | පිළියෙල කරනු ලබන ඉංජිනේරු ඇස්තමේන්තු තුළ අසාමාන්‍ය විචලනයන් නොපැවතිය යුතුය. | රු.මිලියන 100 මූල්‍ය සීමාව ඉක්මවා යන බැවින් මෙම වියදම් ඇස්තමේන්තුවට ඇතුළත් නොකළ බව. |
| **iii.** | ගොඩනැගිල්ලේ බාහිර අලංකරණයට හා රැහැන්වල ආරක්ෂාවට බලපෑම් වන පරිදි විදුලි රැහැන් ඇදීම සඳහා භාවිතා කළ කේසින් (CASING)පිටතට පෙනෙන පරිදි නිමකර තිබුණි. තවද බිල්පතේ Ex.54 යටතේ විදුලි පංකා සවිකිරීමට ආධාරකයක් සැකසීමට රු.282,225 ක් ගෙවීම වැඩිපුර ගෙවීමක් ලෙස නිරීක්ෂණය කරනු ලැබේ. | ඉදිකිරීම් මනා නිමාවකින් යුතුව ඉටුකළ යුතුය. වැඩ විෂය පිළිබඳව පූර්ව අවබෝධයක් සහිතව මිලගණන් ඉදිරිපත් කරයි. එසේ තිබියදී අමතරවැඩ වශයෙන් නැවත ගෙවීම් කිරීම සුදුසු නොවේ. | මූලික සැලසුමට අනුව යෙදූ වයරින් බට භාවිතා කළ නොහැකි වූ බැවින් මෙසේ සිදුකළ බව සහ වහලය උස බැවින් හා විදුලි පංකා එල්ලිය යුතු ස්ථානවල පරාල නොමැති බැවින් වෙනම ව්‍යුහයක් සකස් කිරීමට සිදුවූ බව. |
| **iv.** | ඇස්තමේන්තු විෂයය අංක **C**-1 යටතේ පස් කැපීම හා තුනී කිරීමට ඝණ මීටර් 900 ක් ඇස්තමේන්තු කර තිබුණද, බිල්පත් මගින් මැනුම් වාර්තා තනි මිනුමක් ලෙස ශ්‍රී ලංකා ප්‍රමිත **(SLS** 573) ට පටහැනි අන්දමින් සිදුකර ඝණ මීටර් 9552 ක් සඳහා | ඇස්තමේන්තු විෂය ප්‍රමාණයන් සහ විෂයයට අදාල කළවැඩ අසාමාන්‍ය විචලනයන් නොපැවතිය යුතු බවත්, වෘත්තිකයන් / කාර්මිකයන් තම | කඩිනමින් ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා මිනින්දෝරු මැනුම් අනුව ගණනය කර පස් කැපීම සිදුකල නොහැකි වූ බව, කපා ඉවත් කල පස් අවට පිහිටි පාසැල් |

| | | | |
|---|---|---|---|
| | රු.1,930,432 ක් ගෙවා තිබුණි. තවද කපා ඉවත් කරන ලද පස් ඝන මීටර් 9552 ක ප්‍රමාණය**,** කුමන කාර්යයකට යෙදුවේද යන්න තහවුරුවක්ද ගොනුවේ නොවීය. | වෘත්තිය ඉටුකිරීමේදී වෘත්තීය ප්‍රමිතීන් පිළිබඳව සැලකිලිමත් විය යුතු බවත්, ඉටුකළ කාර්යයන් විධිමත්ව ලේඛනගත කර විනිවිදභාවයකින් යුතුව කටයුතු කළයුතුය. | හා විහාරස්ථාන ආදී ස්ථානවලට බැහැර කළ බව. |

**(ඇ) කොන්ත්‍රාත්තුව සඳහා ගෙවීම් කිරීම, කාලය දීර්ඝ කිරීම හා පවත්වාගෙන යාමේදී සිදුවූ අඩුපාඩු හා මූල්‍ය අලාභ**

**-----------------------------------------------**

| | | | |
|---|---|---|---|
| i. | කර්මාන්තය ආරම්භ කිරීමට පෙර ලබාදිය යුතු වැඩ සැලැස්ම (work Schedule) හා කලවැඩවල ප්‍රගතිය, ඉදිරි කාලය සඳහා නව වැඩ සැලැස්මක්ද ලබා නොගෙන ගොඩනැගිල්ල සඳහා මාස 6½ ක් හා තාප්පය සඳහා දින 90 ක කාලයක්ද, කොන්ත්‍රාත් දින දීර්ඝ ලබාදී තිබුණි. ඉහත කරුණු අනුව ඉංජිනේරුවරුන් වැඩ බිම නිසි අධීක්ෂණයක් සිදුකළේ කෙසේද යන්න විගණනයේදී ප්‍රශ්න සහගතය. | සාධාරණ හේතු පදනම් කරගෙන කොන්ත්‍රාත් කාලය දීර්ඝ කළ යුතුය. වැඩබිම් මනා කළමනාකරණයකින් යුතුව පවත්වා ගෙනයාම සඳහා සැලසුම් කළ යුතුය. | අධීක්ෂණය සඳහා ප්‍රමාණවත් කාර්මික නිලධාරීන් නොමැති බැවින් වැඩ සැලැස්මක් ලබා නොගත් බව, හා භූමියේ පස් ඉවත් කිරීම ප්‍රමාදවීම සහ ගල් ඉවත් කිරීම සඳහා පුපුරණ ද්‍රව්‍ය සපයාගත නොහැකි වීම මත කාලය දීර්ඝ කළ බව. තාප්පය ඉදිකිරීමේ පළමුවර දින දීර්ඝය ලබා නොදී ඉදිරිපත් කළ කරුණු සාධාරණ බැවින් දෙවන දින දීර්ඝය ලබාදුන් බව. |
| ii. | කර්මාන්තයේ ඉතුරුම් ලෙස දක්වා තිබූ රු.14,518,048 ක මුදලින් රු.5,405,626 ක අමතර වැඩ සිදුකර තිබුණි. එසේ වුවද මෙම අමතර වැඩ සඳහා කොන්ත්‍රාත් ගිවිසුමේ පරිදි සියයට 2 වට්ටම රු.108,113 ක මුදල අඩුකර නොතිබුණි. | ඇස්තමේන්තු වැඩ විෂයයන් වෙනුවට අමතර වැඩ සිදුකර තිබුණි. එබැවින් වට්ටම් මුදල් අඩුකර ගත යුතුය. | කොන්ත්‍රාත්කරුගේ වට්ටම් වලංගු වන්නේ ගිවිසුමේ සඳහන් වැඩ සහ එකී ප්‍රමාණයෙන් සියයට 25 දක්වා පමණි. |
| iii. | මිල වැඩිවීම් ගෙවීමට ගිවිසුමේ එකගතාවයක් නොතිබුණද අවසාන බිල්පත මගින් මිල වැඩිවීම් සඳහා රු.3,324,543 ක් ගෙවීම් කර තිබුණි. | සියළු ගෙවීම් නීත්‍යානුකූල වන පරිදි ඉටුකළ යුතුය. | ගිවිසුම අත්සන් කිරීමේදී ඇති වූ ප්‍රමාද දෝෂයකි. |

| | | | |
|---|---|---|---|
| iv. | ප්‍රමාද වන සෑම දිනටම ප්‍රමාද ගාස්තු ලෙස සියයට 0.05 ක් අයකළ යුතු වුවද දිනකට සියයට 0.025 ක් අයකර තිබුණි. තවද ගොඩනැගිල්ල ඉදිකිරීම කර්මාන්තයේ ප්‍රමාද දින 326 කට අදාලව ගිවිසුම ප්‍රකාරව රු.6,120,806 ක ප්‍රමාද ගාස්තු සහ මායිම් තාප්පය ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රමාද දින 150 ක් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු වශයෙන් රු.1,265,414 ක් අයකළ යුතුව තිබුණි. | රජයට අයවිය යුතු ලැබීම් අයකර දීමට නිලධාරීන් කටයුතු කළයුතු අතර නිලධාරීන් අවංකව තම සේවය සැලසිය යුතුය. | වැඩ අවසන් වාර්තාව දිස්ත්‍රික් ඉංජිනේරු වෙත 2020.06.01 දින එනම් මාස 14 කට පසු ලැබී ඇති බව දන්වා ඇත. තාප්පය සඳහා ප්‍රමාද ගාස්තු අවසන් බිල්පත් මගින් අයකරන බව. |
| v. | ගිවිසුම් ප්‍රකාරව ආපසු අයකළ යුතු අත්තිකාරම් මුදල් බිල්පත් 01 සිට 03 දක්වා මාස 06 ක් තුළ නිසි පරිදි අය නොකිරීම හේතුවෙන් රු.5,558,482 ක රජයේ මුදල් අවභාවිතා කිරීමක් සිදුව තිබුණි. | රජයේ මුදල් නියමිත දිනයන්හි අයකිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී සම්මත ලංසු තැබීමේ ලේඛන **(SBD)** උපදෙස් හා කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් පරිදි කටයුතු කිරීමට සටහන් කරගත් බව. |
| vi. | කර්මාන්ත අවසාන බිල්පත ගෙවීමේදී ඉතුරුම්, **(saving)** අත්හළ වැඩ, වැඩිපුර කළවැඩ ඇතුලත්ව සංසන්දනාත්මක ප්‍රකාශය සකස් කර නොතිබුණි. තවද, කර්මාන්තය නිම කිරීමෙන් පසු ඉදිරිපත් කළයුතු සැලසුම් (AS build Drawing), හිමිකම් නොපෑම් සහතිකය නිම කිරීමේ සහතිකය ලබාගෙන නොතිබුණි. මේ තත්ත්වය මත අනාගතයේ මෙහි ඇතිවන අළුත්වැඩියා, නිවැරදි කිරීම් සිදුකිරීමට නොහැකි තත්ත්වයක් පැන නගින බවත්, ගිවිසුම ප්‍රකාරව බැඳීම් නිදහස් කළ බවට වූ සනාථ කිරීම් ලබා නොගැනීම තුළින් අනාගතයේදී කොන්ත්‍රාත්කරු තවදුරටත් බැඳීම් ඇතිකර ගැනීම සඳහා අවස්ථාව සැලසී තිබුණු බවත් නිරීක්ෂණය විය. | නිලධාරීන් තම වගකීම මනා විනිවිදභාවයකින් යුතුව ඉටුකළ යුතුය. | සන්සන්දනාත්මක ප්‍රකාශ සකස් කිරීම අත්‍යවශ්‍ය නොවේ. අතිරේක වැඩ කොටස් බිල්පත් මගින් සොයාගත හැක. **AS build drawings** සඳහා ඇස්තමේන්තුවෙන් මුදල් වෙන්කර නොමැති නිසා එය සිදුකර නොමැත. හිමිකම් නොපෑමේ සහතිකය ලබාගැනීම විශාල ව්‍යාපෘති සඳහා සිදුකරන බැවින්, එය සිදු කර නොමැත. |

| | | |
|---|---|---|
| vii. ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල සහ තාප්පය ඉදිකිරීම් සැලසුම් නාගරික සංවර්ධන අධිකාරිය/ පළාත් පාලන ආයතන වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | රජයේ නීති රීති වලට අනුගතව කටයුතු කළයුතුය. | කිසිදු රජයේ ගොඩනැගිල්ලක් සඳහා අදාල අනුමැතිය ලබාගෙන නොමැති බව. ඉදිරියේදී අදාල අනුමැතිය සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බව. |

**3.4 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුවූ සමාලෝචිත වර්ෂය අවසාන වන විට මාස 12 ත් වර්ෂ 32 ත් අතර කාලසීමාවක් ගතව තිබුණු රු.25,000 ට අඩු වටිනාකමින් යුතු සිදුවීම් 09 කට අදාළව එකතුව රු.73,253 ක හානි හා පාඩු ද, රු.25,000 ට වැඩි වටිනාකමින් යුතු සිදුවීම් 20 කට අදාළව එකතුව රු.8,233,211 ක වටිනාකමින් යුතු හානි හා පාඩු ද සම්බන්ධ ලිපිගොනුවල කටයුතු නිමකර නොතිබුණි. | අයකර ගැනීමට හෝ කපාහැරීමට සම්බන්ධ ලිපිගොනු කටයුතු නොපමාව ඉටුකළ යුතුය. | ලිපිගොනුවල අදාල කටයුතු සිදුකර ගෙන යනු ලබන බව. |

**3.5 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජය විසින් මිලදීගත් වී තොග ටෙන්ඩර් කොට විකිණීම තාවකාලිකව අත්හිටුවීමට 2019 ජුනි මස 18 වන දින පැවති ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීමේදී තීරණය වී තිබියදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2018/19 මහ කන්නයට අදාලව ගොවීන්ගෙන් ලබාගත් වී මෙට්‍රික් ටොන් 8578.75 ක් විකිණීම සඳහා 2019 ජූලි 01 දින ප්‍රසම්පාදන දැන්වීම භාෂාත්‍රයෙන් පුවත්පත් තුනක පලකිරීම වෙනුවෙන් 2019 ජූලි මස අංක 7/235 දරන වවුචරයෙන් රු.161,460 ක් පුවත්පත් නියෝජිතයකු වෙත ගෙවා තිබුණි. | ජාතික වශයෙන් ගනු ලබන තීරණ අදාල ආයතන වෙත නොපමාව සන්නිවේදනය කිරීමට කටයුතු කළයුතු අතර, අනවශ්‍ය වියදම් අවම කර ගැනීමට කටයුතු කළයුතු වීම. | ටෙන්ඩර් කැඳවීම් තාවකාලිකව අත්හිටුවා ඇති බව කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් දන්වන ලද්දේ 2019.07.10 දින බැවින් 2019.07.01 දින පුවත්පත් නිවේදනය පලකිරීම වලක්වා ගැනීමට හැකියාවක් නොලැබුණු බව. |

**3.6** **කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **i.** 2003 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයටත් පසුව තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයටත් අයත් වූ දකුණු බටඅත එරඹුගලයාය පිහිටි අංක 16 දරන ගල්වල පිහිටි අක්කර 04 ක් වූ රජයේ ඉඩම එක් පුද්ගලයකු විසින් තමා දීර්ඝකාලයක් ඉඩම භුක්තිවිඳීම හේතුකොටගෙන තමාගේ නමින් ප්‍රකාශන ඔප්පුවක් පිළියෙල කර 2018 මාර්තු 14 වන දින තංගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර තිබුණි. රජයේ ඉඩම අනවසර පරිහරණයට යොදා ගැනීම හා තමා නමට ලියාපදිංචි කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙක විසින්ම කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | රජයේ ඉඩම් සම්බන්ධයෙන් රජයේ ඉඩම් ආඥා පනතේ ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතුය. | නිරීක්ෂණය පිළිගෙන ඇත. හිඟ මුදල් ඉදිරියේදී අයකරන බවත්, ක්‍රමවේදය නිවැරදි කර ඉදිරියේදී බලපත්‍ර ලබාදීමට කටයුතු කරන බව. |
| **ii.** අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ලියන්ගස්තොට ප්‍රදේශයේ පවත්වා ගෙන යන කළුගල් වැඩබිමේ ආරම්භය වූ 2017 ඔක්තෝබර් 23 සිට 2019 ඔක්තෝබර් 16 දක්වා පුපුරණ ද්‍රව්‍ය කි.ග්‍රෑ.26244 ක් නිකුත් කර තිබූ අතර, භූ විද්‍යා සමික්ෂණ හා පතල් කාර්යාංශයේ නිලධාරීන්ගේ 2019 ඔක්තෝබර් 16 දින ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව අනුව කැණීම් කරන ලද මුළු කළුගල් පරිමාව කියුබ් 12656 කි. ඒ සඳහා වැයවන අවම පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය කි.ග්‍රෑම් 6328 කි. ඒ අනුව ඉතිරි පුපුරණ ද්‍රව්‍ය කි.ග්‍රෑම් 19916 ක් හෙවත් නිකුත් කළ ප්‍රමාණයෙන් සියයට 76 ක අතිරික්ත පුපුරණ ද්‍රව්‍ය කුමන කාර්යයක් සඳහා යොදා ගත්තේද යන්න අනාවරණය නොවුණි. | සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක විසින් නිකුත් කරනු ලබන පුපුරණ ද්‍රව්‍ය අදාල කාර්යයන් සඳහා යොදා ගනු ලබන්නේද යන්න පිළිබඳව විධිමත් පසු විපරම් ක්‍රියාවලියක් මගින් තහවුරු කරගත යුතු අතර මෙසේ අතිරික්ත පුපුරණ ද්‍රව්‍ය බාහිර පාර්ශවයන්ට මුදා හැරීම ජාතික ආරක්ෂාව පිළිබඳවද අවධානය යොමු විය යුතු කරුණකි. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් තොරතුරු ලබාගෙන පිළිතුරු ඉදිරිපත් කරන බව. |

| | | |
|---|---|---|
| **iii.** 2011 යල කන්නයේ වී මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලද මුදලින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ එක් සමුපකාර සමිතියක් වෙත 2011 අගෝස්තු 11 වන දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ලබාදුන් පොළී රහිත අත්තිකාරම් මුදලින් රු.මිලියන 5 ක් විගණිත දිනය වූ 2020 පෙබරවාරි 06 දිනට අයවී නොතිබුණි. | ජාතික අවශ්‍යතාවයන් වෙනුවෙන් බාහිර පාර්ශවයන්ට ලබාදුන් රජයේ මුදල් අප්‍රමාදව අයකර ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතුය. | මෙම මුදල අයකර ගැනීමට නිරන්තරයෙන් කටයුතු කළද මේ දක්වා අයවී නොමැති බවත් ඉදිරියේදී නීත්‍යානුකූලව කටයුතු කරන බව. |

**4.** **යහපාලනය**
**-------------**

**4.1** **මහජනයා වෙත සේවා ඉටු කිරිම**
**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | -------------- | ------------------------ |
| (අ) i. සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී සමෘද්ධි සංවර්ධන නිලධාරී, ග්‍රාම නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී හා ප්‍රජා මූල සංවිධානයේ සභාපති යන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ලේඛනගත කරන ලද ප්‍රතිලාභීන් 21 දෙනෙකුගෙන් යුත් ප්‍රමුඛතා ලේඛනයේ අනුපිළිවෙල නොසලකා හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අරවනමුල්ල ග්‍රාම නිලධාරී වසමේ ප්‍රමුඛතා ලේඛනයේ පළමු 07 දෙනා සමඟ අවසන් 04 දෙනාට සමෘද්ධි සහනාධාර හිමිකම්පත් ලබාදී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව ප්‍රතිලාභීන් තෝරාගැනීම හා ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුය. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| | ii. විගණන පරීක්ෂාවට අනුව හම්බන්තොට හා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙහි ග්‍රාම නිලධාරී කොට්ඨාශ 03 ක වඩාත් සුදුසුකම් සහිත ප්‍රමුඛතා ලේඛනයේ නම සඳහන් වූ පවුල් 30 ක් සඳහා ද ප්‍රමුඛතා ලේඛනයේ නම් සඳහන් නොවූ එහෙත් සුදුසුකම් සහිත පවුල් 05 ක් සඳහාද සමෘද්ධි ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව නියමිත නිර්නායක අනුව ප්‍රතිලාභීන් තෝරාගැනීම හා ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුය. | දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතා ලේඛනගත කරන ලද පුද්ගලයින් 15817 ගේ නාමලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලද අතර, අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර තිබූ ප්‍රමාණය 13227 ක් බවත් ප්‍රමුඛතා ලේඛනයේ සඳහන් ප්‍රමුඛතාවය නොසලකා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර එවා තිබූ ලේඛනයට අනුව සහනාධාර ලබාදීමට කටයුතු කළ බව. |
| | iii. සහනාධාර ලබාදීමේ නිර්නායකවල ප්‍රමුඛතාවය නොසලකා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ දෙකක ආදායම් මාර්ග හිමි ප්‍රතිලාභීන් 04 දෙනෙකු වෙත සමෘද්ධි ප්‍රතිලාභ ලබාදී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව ප්‍රතිලාභීන් තෝරාගැනීම හා ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබාදී නැත. |
| (ආ) | බෙලිඅත්ත, තංගල්ල, ඕකෙවෙල සහ වීරකැටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හතරෙහි ප්‍රතිලාභීන් 1209 ක් වෙනුවෙන් ගම්පෙරළිය නිවාස සංවර්ධන වැඩසටහන යටතේ දිළිඳු පවුල්වල තාවකාලික වහල ස්ථිර වහල බවට පරිවර්ථනය කිරීම සඳහා 2019 වර්ෂයේදී රු.120,806,068 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | චක්‍රලේඛ උපදෙස් වල සඳහන් නිර්නායක අනුව සුදුසුම ප්‍රතිලාභියා තෝරා ගැනීම සඳහා කටයුතු කළයුතුය. | ප්‍රතිලාභීන් තේරීමේ බලය දිස්ත්‍රික් ලේකම්ට හෝ එම නිලධාරීන්ට හිමිනොවූ බවත්, එසේ වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අදාල නිලධාරීන් යොදවා ප්‍රතිලාභීන් පිළිබඳව පරීක්ෂා කොට ආධාර ලබාදීම සිදුකළ බව. |

| | | | |
|---|---|---|---|
| i. | දිස්ත්‍රික්කයේ ඉහල දරිද්‍රතා මට්ටමක් ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තෝරා නොගෙන පහල දරිද්‍රතා මට්ටමක් සහිත ඉහත සඳහන් ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ තෝරා ගෙන තිබුණද ප්‍රතිලාභීන් තෝරා ගැනීම විධිමත් ක්‍රමවේදයකට අනුව සිදුවී නොතිබුණි. | ඉහත නිර්දේශය අදාල වේ. | ඉහත අදහස් දැක්වීම අදාල වේ. |
| ii. | ප්‍රතිලාභීන් තෝරා ගැනීමට නිවැරදි හා අදාල නිර්නායක යොදා නොගැනීම නිසා ප්‍රතිලාභීන් 567 දෙනෙකු සඳහා වෙන්කළ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 80 දක්වා ප්‍රමාණයක් පමණක් ගෙවා තිබූ අතර තවත් ප්‍රතිලාභීන් 86 දෙනෙකුට ආධාර මුදල් ගෙවා නොතිබුණි. | ඉහත නිර්දේශය අදාල වේ. | ඉහත අදහස් දැක්වීම අදාල වේ. |

**5. මානව සම්පත් කළමනාකරණය**
-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | --------------------------------- |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 114 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. අතිරික්ත කාර්ය මණ්ඩලය 07 දෙනෙකු සම්බන්ධයෙන්ද අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිරවීමටත් අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා විධිමත් අනුමැතියක් ලබාගැනීමටත් කටයුතු කළයුතුය. | සමස්ථයක් ලෙස ගත් විට පවතිනුයේ පුරප්පාඩු පමණි. අතිරික්ත ලෙස දැක්වීම සිදු වන්නේ අදාළ ශ්‍රේණියට වැඩි ප්‍රමාණයක් එම ශ්‍රේණියේ සිටීමයි.<br><br>පුරප්පාඩු සම්බන්ධයෙන් සෑම වර්ෂයකදීම රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දන්වා යැවීමට කටයුතු යොදා ඇති අතර නවක නිලධාරීන් ලද පසු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරයි. |